1978-9-6

# ජාතික රාජ්‍ය සභාවේ

# 1978 අංක 38 දරන පළාත් පාලන ආයතන (ප්‍රජා අශක්නුතා නියම කිරීමේ) (අංක 1) පනත

[සහතිකය සටහන් කළේ 1978 අගෝස්තු මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පිළිදි මුද්‍රණය කරන ලදී.

(1978 අගෝස්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිළ : ශත 30 යි		තැපැල් ගාස්තුව : ශත 15 යි

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 38 දරන පළාත් පාලන ආයතන (ප්‍රජා අශක්නුතා නියම කිරීමේ) (අංක 1) පනත

සහතිකය සටහන් කළේ 1978 අගෝස්තු මස 14 වන දින]

එල්.ඩී.—ඔ. 55/78

**පරීක්ෂණ කොමිසමක් විසින් යම් තැනැත්තන්ට විරුද්ධව තීරණ කර තිබේ ද ඒ තැනැත්තන්ට ප්‍රජා අශක්නුතා නියම කිරීම පිණිස හා ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පූර්විකාව.

1977 අගෝස්තු මස 20 වන දින අංක 278/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 1977 අගෝස්තු මස 19 වන දින දරන බලපත්‍රය මගින්, ඒ බලපත්‍රයෙහි සඳහන් එක් එක් මහා නගර සභාවේ කටයුතු පරිපාලනය කිරීමෙහි ලා පැන නැගෙන්නා වූ එකී බලපත්‍රයෙහි දක්වා ඇති කාරණා සම්බන්ධයෙන් පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා, ගාර්දියෙ පුංචිහේවගේ අමරසිල සිල්වා මහතාගෙන් සමන්විත පරීක්ෂණ කොමිසමක් (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ හෙයින් ද :

එකී පරීක්ෂණ කොමිසම විසින් ස්වකීය වාර්තාවල ඇතැම් තැනැත්තන්ට විරුද්ධව ඇතැම් තීරණ කර ඇති හෙයින් ද :

පොදු යහපත උදෙසා එකී තැනැත්තන් විෂයයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීම හා එකී කොමිසමේ තීරණවල ප්‍රතිඵලයක් වශයෙන් වෙනත් විධිවිධාන සැලසීම අවශ්‍යව ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 38 දරන පළාත් පාලන ආයතන (ප්‍රජා අශක්නුතා නියම කිරීමේ) (අංක 1) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අදාළ තැනැත්තන් ඡන්දය දීමට හෝ තෝරා පත් කර ගනු ලැබීමට හෝ සුදුසු නොවන බව.

**2.** (1) සෑම අදාළ තැනැත්තකු ම, මේ පනත ආරම්භ වන දිනයෙහි සිට අවුරුදු හතක කාලයක් සඳහා, යම් පළාත් පාලන ආයතනයක සභිකයන් තෝරා පත් කර ගැනීම පිණිස වූ යම් ඡන්ද විමසීමක දී ඡන්දදායකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීමට හෝ ඡන්දය දීමට නැතහොත් යම් පළාත් පාලන ආයතනයකට සභිකයකු හෝ සභිකයන් තෝරා පත් කර ගැනීම පිණිස වූ යම් ඡන්ද විමසීමක දී අපේක්ෂකයකු වශයෙන් නාමයෝජනා කරනු ලැබීමට නැතහොත් යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් තෝරා පත් කර ගැනීමට හෝ එහි අසුන් ගැනීමට හෝ එහි දී ඡන්දය දීමට හෝ සුදුස්සකු නොවිය යුතු ය.

(2) යම් පළාත් පාලන ආයතනයක යම් ඡන්ද විමසීම් ප්‍රදේශයක් සඳහා ඡන්ද හිමි නාමලේඛනයක් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ පිළියෙළ කොට සහතික කිරීමේ දී ඒ පළාත් පාලන ආයතනයේ ඡන්ද විමසීම් ප්‍රදේශයට අනුරූප වන, බලාත්මකව පවත්නා පාර්ලිමේන්තු මැතිවරණ නාමලේඛනයෙහි හෝ එහි කොටසක අදාළ යම් තැනැත්තකුගේ නම දක්වෙන්නේ වුව ද ඒ සෑම තැනැත්තකුගේ ම නම ඒ ඡන්ද හිමි නාමලේඛනයෙන් අස් කරනු ලැබිය යුතු ය.

2—ඒ 35357—11,660 (78/08)

(3) එවැනි යම් ඡන්ද විමසීමක දී එවැනි යම් තැනැත්තකු අපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කිරීම හෝ එවැනි යම් තැනැත්තකුගේ නම අපේක්ෂකයන්ගේ යම් ලැයිස්තුවක හෝ ලැයිස්තුවල ඇතුළත් කිරීම, සියලු කාර්ය සඳහා, ශූන්‍ය හා බල රහිත යයි සලකනු ලැබිය යුතු ය.

අධිකරණ හෝ වෙනත් රජයේ ධුර සඳහා සුදුසු නොවන බව.

3. මෙහි 2(1) වන වගන්තියෙහි විධිවිධාන යටතේ සුදුස්සකු නොවන සෑම තැනැත්තකු ම, සියලු කල්හි, යම් අධිකරණ ධුරයකට පත් කරනු ලැබීමට හෝ රාජ්‍ය සේවකයකු වශයෙන් හෝ පළාත් පාලන සේවයෙහි, යම් පළාත් පාලන ආයතනයක හෝ යම් උපලේඛනගත ආයතනයක හෝ සේවා නියුක්තයකු වශයෙන් හෝ සේවයෙහි නියුක්ත කරනු ලැබීමට නැතහොත් යම් උපලේඛනගත ආයතනයක හෝ එහි පාලක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ පත් කර ගනු ලැබීමට හෝ නම කරනු ලැබීමට නොහැකි විය යුතු ය.

කොමිසමේ වාර්තාවල ප්‍රතිඵලයක් වශයෙන් සේවයෙන් පහ කරනු ලැබූ රාජ්‍ය හා වෙනත් නිලධරයන්ට අදාළ නුසුදුසුකම්.

4. ඉහත කී පරීක්ෂණ කොමිසමේ වාර්තා අතුරින් යම් වාර්තාවක විරුද්ධව යම් තීරණයක් කර ඇත්තාවූ ද එවැනි යම් වාර්තාවක දිනයෙහි රාජ්‍ය නිලධරයකුව සිට හෝ පළාත් පාලන සේවයෙහි හෝ යම් පළාත් පාලන ආයතනයක සේවා නියුක්තයකුව සිට, ඒ තැනැත්තා අයත් වූයේ යම් වර්ගයකට ද ඒ වර්ගයේ විනය පාලනය සම්බන්ධයෙන් අදාළ විය හැකි යම් කාර්ය පටිපාටියක් අනුව ක්‍රියා කරනු ලැබීමෙන් පසු සේවයෙන් පහ කරන ලද්ද වූ ද නැතහොත් සේවය අත්හිටවනු ලද්දවූ ද සෑම තැනැත්තකු ම, ඔහු සේවයෙන් පහ කරනු ලැබූ හෝ ඔහුගේ සේවය අත්හිටවනු ලැබූ දිනයෙහි සිට, අදාළ තැනැත්තකු 2 වන හා 3 වන වගන්තිවල දැක්වෙන යම් නුසුදුසුකම්වලට යටත් වන්නේ ද ඒ නුසුදුසුකම්වලට ම යටත් විය යුතු ය.

පාඩු අය කර ගැනීම.

5. (1) එකී කොමිසමේ යම් වාර්තාවක කවර හෝ තැනැත්තකුට විරුද්ධව, ඒ තැනැත්තා විසින් යම් පළාත් පාලන ආයතනයකට පාඩු සිදු කර ඇතැයි යම් තීරණයක් කර ඇති අවස්ථාවක විගණකාධිපතිවරයා විසින් ඒ පාඩුවේ ප්‍රමාණය තක්සේරු කරනු ලැබිය යුතු අතර, විගණකාධිපතිවරයා විසින්, ඒ පාඩුවේ ප්‍රමාණය පිළිබඳ කරන ලද තක්සේරු කිරීම සම්බන්ධයෙන් තමා වෙත කරුණු ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට අවස්ථාවක් ලබා දීමෙන් පසු, ඒ පාඩුවේ ප්‍රමාණය සහතික කරමින් තම අත්සන යටතේ වූ සහතිකයක් විගණකාධිපතිවරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) එවැනි යම් සහතිකයක වූ යම් ප්‍රකාශයක හෝ එහි සහතික කර ඇති පාඩුවේ ප්‍රමාණය පිළිබඳ හෝ නිරවද්‍යතාව, ඒ පාඩුව අය කර ගැනීම සඳහා යම් අධිකරණයක වූ යම් නඩු කටයුත්තක දී හෝ අන්‍යාකාරයකින් හෝ ප්‍රශ්න කරනු නොලැබිය යුතු අතර එහි ඇතුළත් සියලු කාරණා සම්බන්ධයෙන් එය තීරණාත්මක විය යුතු ය. තව ද එවැනි යම් සහතිකයක වූ යම් ප්‍රකාශයක හෝ එහි සහතික කර ඇති පාඩුවේ ප්‍රමාණය පිළිබඳ හෝ නිරවද්‍යතාව, මෙහි මින් මතු සඳහන් අය කර ගැනීමේ නඩු කටයුතුවල දී, සාක්ෂ්‍යයේ දී ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

(3) සහතිකයේ නම කර ඇති තැනැත්තා වෙත ඒ සහතිකයේ පිටපතක් භාර දෙනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා විසින්, ඒ සහතිකය

තමා වෙත තැපැල් කරනු ලැබූ දිනයෙහි සිට දින තිහක කාලයක් ඇතුළත සහතිකයේ දක්වා ඇති මුදල විගණකාධිපතිවරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(4) ඒ සහතිකයේ පිටපතක් ඒ තැනැත්තාගේ අවසන් වරට දන්න සිටි පදිංචි ස්ථානය අමතා ලියාපදිංචි කළ ලිපියක් මගින් තැපැලෙන් ඒ තැනැත්තා වෙත යවනු ලැබූ විට එය ඔහු වෙත යථා පරිදි භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) ඒ වාර්තාවලින්, පාඩු සිදු කර ඇතැයි තීරණය කරනු ලැබ ඇත්තේ යම් පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ද ඒ ඒ පළාත් පාලන ආයතන වල බැරට, විගණකාධිපතිවරයාට ලැබෙන ඒ සියලු ගෙවීම් ඔහු විසින් බැර කරනු ලැබිය යුතු ය.

(6) ඉහත කී පරිදි සහතිකයක් භාර දී ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගෙන් අය විය යුතුව ඇති මුදල, ඒ සහතිකයෙහි දක්වා ඇති පරිදි ඉහත කී කාලය ඇතුළත ගෙවීමට ඔහු අපොහොසත් වන අවස්ථාවක, ඒ මුදල ගෙවීම පැහැර හැර ඇතැයි සලකනු ලැබිය යුතු අතර, විගණකාධිපතිවරයා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් හෝ ඒ තැනැත්තා වාසය කරන හෝ වාසය කළේ යයි අවසන් වරට දන්න සිටි ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කිරීමෙන්, ඒ මුදල මහෙස්ත්‍රාත්වරයකු විසින් ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩයේ ප්‍රමාණය ඉක්මවන්නේ වුව ද එය නොතකා, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට නියම කරන ලද දඩයක් මෙන් අය කර ගනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ වූ වැරදි.

**6.** මේ පනත යටතේ පුද්ගලයකු නොවන හා—

(අ) යම් පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වූ යම් ඡන්ද හිමි නාමලේඛනයක ඡන්දදායකයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීමට ඉල්ලා සිටින ;

(ආ) යම් පළාත් පාලන ආයතනයක යම් සභිකයකු තෝරා පත් කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීමක දී ඡන්දය දෙන ;

(ඇ) යම් පළාත් පාලන ආයතනයක යම් සභිකයකු තෝරා පත් කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීමේ දී අපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබීමට ස්වකීය කැමැත්ත දන්වා සිටින ;

(ඈ) යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් අසුන් ගෙන ඡන්දය දෙන ;

(ඉ) අධිකරණ නිලධරයකු, රාජ්‍ය නිලධරයකු ලෙස ධුරය භාර ගන්නා හෝ ඒ තත්ත්වයෙන් ක්‍රියා කරන නැතහොත් පළාත් පාලන සේවයේ, යම් පළාත් පාලන ආයතනයක හෝ යම් උපලේඛනගත ආයතනයක සේවා නියුක්තයකු ලෙස ධුරය භාරගන්නා හෝ ඒ තත්ත්වයෙන් ක්‍රියා කරන ;

(ඊ) යම් උපලේඛනගත ආයතනයක හෝ එහි පාලක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීම සඳහා නාම යෝජනා කරනු ලැබීමට කැමැත්ත දෙන හෝ එවැනි සාමාජිකයකු වශයෙන් පත්වීමක් භාර ගන්නා නැතහොත් නාම යෝජනා කරනු ලැබීම භාර ගන්නා

සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය. [illegible]

අර්ථ නිරූපණය.

7. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙ පනතෙහි—

" පළාත් පාලන ආයතනය " යන්නෙන්, යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට සහ කාර්යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියක් මගින් හෝ යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

" අදාළ තැනැත්තා " යන්නෙන්—

(අ) (i) බලය අනිසි ලෙස පාවිච්චි කිරීම ;

(ii) දූෂණය ;

(iii) පත්කිරීම් සිදුකිරීමෙහි ලා අක්‍රමිකතාවන්

සංයුක්ත කරන යම් ක්‍රියාවක් කර ඇති බවට හෝ කිරීමෙහි ලා ආධාර හා අනුබල දී ඇති බවට,

(ආ) යම් ලිඛිත නීතියක යම් විධිවිධාන කඩ කර ඇති බවට නැතහොත් කඩකිරීමෙහි ලා ආධාර හා අනුබල දී ඇති බවට,

මෙ පනතේ සඳහන් පරීක්ෂණ කොමිසමේ යම් වාර්තාවකින් තීරණය කර ඇති තැනැත්තකු අදහස් වන අතර මෙ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති එක් එක් තැනැත්තා ද ඉන් අදහස් වේ ;

" උපලේඛනගත ආයතනය " යන්නෙන්, අල්ලස් පනතේ උප ලේඛනයෙහි තත් කාලයෙහි නිශ්චිතව සඳහන් යම් මණ්ඩල යක්, ආයතනයක්, සංස්ථාවක් හෝ වෙනත් මණ්ඩලයක් ද අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් යයි යම් ප්‍රඥප්තියක විධිවිධාන යටතේ සැලකෙන යම් මණ්ඩලයක්, ආයතනයක්, සංස්ථාවක් හෝ වෙනත් මණ්ඩල

යක් ද අදහස් වන අතර, ඒ මණ්ඩලය, ආයතනය, සංස්ථාව හෝ වෙනත් මණ්ඩලය විසින් සම්පූර්ණ ප්‍රාග්ධනයට හෝ ඉන් කොටසකට දායක වූ යම් සංවිධානයක් ද එයට ඇතුළත් වේ ;

" රාජ්‍ය නිලධරයා " යන්නෙන්, ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි අර්ථ කථනය කර ඇති පරිදි රාජ්‍ය නිලධරයකු අදහස් වන අතර රජයේ සේවකයෙක් ද ඊට ඇතුළත් වේ.

## උපලේඛනය

අබ්දුල් හමීඩ් මොහමඩ් ෆවුසි, කොළඹ මහා නගර සභාවේ හිටපු නගරාධිපති වරයා.

ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක, හිටපු රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා.

මොහමඩ් ෂරිෆ් මොහමඩ් සාරුක්, කොළඹ මහා නගර සභාවේ හිටපු සභික.

මොහමඩ් හනිෆා ජවුෆරස් සදික්, කොළඹ මහා නගර සභාවේ විශ්‍රාමලත් නාගරික තක්සේරුකරු.

නුගේගොඩගේ දොන් නිකලස් ගුණසේකර, මීගමුව මහා නගර සභාවේ විශ්‍රාම ලත් විශේෂ කොමසාරිස්වරයා.

බියන්විලගේ ජෝසප් පෙරේරා, දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාවේ විශ්‍රාම ලත් කාර්මික මාණ්ඩලික සහකාර.

උපාලි රාජපක්ෂ, රත්නපුර මහා නගර සභාවේ හිටපු නගරාධිපතිවරයා.

පැට්සන් සමරවීර, රත්නපුර මහා නගර සභාවේ හිටපු සභික.